# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,205— 1960 සැප්තැම්බර් 23 වැනි සිකුරාද — 23.9.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය–පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 727 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 732 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කල ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 403 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 740 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායිි සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීනු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධ්‍යනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

සංලක්ෂ්‍යය.—“නව ප්‍රවේශක නිලධාරීහු” යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ඈඳී ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. අවශ්‍ය සුදුසුකම්.—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. “ලාංකික” යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටින් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### කාර්මික පරිපාලක තනතුර

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්මික පරිපාලක තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම්පත්‍ර තම අත් අකුරින්ම පුරවා, 1960 ඔක්තෝබර් මස 14 වන දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ “බන්ධනාගාර කොමසාරිස්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 9” යන ලිපිනයට එවිය යුතුයි.

ස. ල.—ඉල්ලුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ “කාර්මික පරිපාලක තනතුර සඳහා ඉල්ලුම් කිරීම” යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම්පත්‍ර ලැබුණු වග දනුම් දෙනු නො ලැබේ.

2. වැටුප් ක්‍රමය.—රු. 1,146න් පටන් ගෙන රුපියල් 48 වාර්ෂික වැඩිවීම 11කින් රු. 1,674 දක්වා වැඩිවන වාර්ෂික වැටුපක් හිමි වේ. රු. 1,296ට පැමිණීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමක් ද වේ.

3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි—

(අ) පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) පත්වීම තුන් අවුරුදු පරීක්ෂාවකට භාජන වේ.

(ඇ) තෝරාපත් කරගත් අපේක්ෂකයා විසින් බන්ධනාගාර නිලධාරීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ පුහුණුවීමේ කෙටි පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ යුතුයි.

(ඈ) තෝරා පත්කරගත් අපේක්ෂකයා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සූදානම් විය යුතුයි.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම ඉල්ලුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(අ) 1960 ඔක්තෝබර් මස 14 වන දිනට අවුරුදු 24 ට නො අඩු හෝ අවුරුදු 45 ට නො වැඩි බව,

(ආ) සෑහෙන ප්‍රමාණයෙන් සමත් වී ඇති බව,

(ඇ) පහත සඳහන් විෂයයන්ගෙන් එකකින් හෝ වැඩි ගණනකින් ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන කාර්මික ගුරු සහතික පත්‍ර පරීක්ෂණයෙන් සාමාර්ථය ලබා ඇති බව සහ එම කර්මාන්තයන්ගෙන් එකක් ගැන පස් අවුරුදු ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බව—

(i) වේවැල් වැඩ,
(ii) ලෝහ වැඩ,
(iii) ඇඳුම් මැසීම, සහ
(iv) වඩු වැඩ, හෝ

(ඈ) කාර්මික වැඩ පළ වල ක්‍රම පිළිබඳව ද, කම්කරු පාලනය ගැන සහ කාර්මික කාර්යක්ෂමතාවය සහ නිෂ්පාදනයන් දියුණු කිරීම ගැන ද, අවුරුදු 10 ක ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බව,

5. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික පිටපත් පමණක් අමුණා එවිය යුතු.—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය,

(ඇ) කාර්මික සහ වෘත්තීය සහතිකය, සහ

(ඈ) චරිතය පිළිබඳ ළඟදී ලබාගත් සහතික තුනක්.

6. මෙම ගැසට් පත්‍රයේ (I) වෙනි කොටසේ (II) වෙනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල වන පොදු කොන්දේසි බලනු මැනවි.

7. මෙම නිවේදනයේ ප්‍රකාර නො වන සියලුම අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ව. නා. පිල්ලේ,
බන්ධනාගාර කොමසාරිස්,

1960 සැප්තැම්බර් 16 වැනිදා,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

### ආකෘති පත්‍රය

### බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්මික පරිපාලක තනතුරු සඳහා ඉල්ලුම් කිරීම

(එවිය යුත්තේ සහතික වල පිටපත් මිස මුල් සහතික නොවේ. එවනු ලබන සහතික ආපසු නො එවනවාත් හැර තැපැලෙන් නැති වන සහතික ගැන දෙපාර්තමේන්තුව වග කියන්නේ ද නැත.)

1. සම්පූර්ණ නම :————.
   නම :————.
   වාසගම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය හා 60.10.14 වැනි දිනට වයස:————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
4. පියාගේ නම හා රක්ෂාව :————.
5. උපන් ස්ථානය:—
   (අ) අයදුම්කරුගේ පියා :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
6. (අ) ජාතිය :————.
   (ආ) ඔබ ලාංකිකයෙක් ද යන වග—
   (i) උත්පත්තියෙන් ද ? :————.
   (ii) නැත්නම් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද? :————.
7. කසාද බැඳලා ද නැද්ද යන වග :————.
8. අධ්‍යාපන සුදුසුකම්:—
   (අ) සිංහල:————.
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

9. කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද ගැන විස්තර (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

10. දනට රක්ෂාවක් තිබේ නම් එය :————.

11. චරිත සහතික දෙනු ලබන්නන්ගේ නම් සහ ලිපිනයන් :————.

12. පාසලින් අස්වූදා සිට කරන ලද රැකියාවන් :————. (ස්වාමියාගේ නම, සේවය හා සේවාකාලය සඳහන් කරන්න. අපේක්ෂකයා රජයේ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර සැපැයිය යුතුයි.)

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

9314

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### පාඨශාලා පරීක්ෂක තනතුරු ශ්‍රේණිය I

මෙහි පහත දක්වෙන 4 වැනි ඡේදයේ සඳහන් වූ කොන්දේසි තෘප්ත කරවන පිරිමි හා ගැහැණු ධුරාපේක්ෂකයන්ගෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ I වැනි ශ්‍රේණියේ පාඨශාලා පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා තිබෙන ආදර්ශ පෝරමයෙහි ඉල්ලුම් පත් පිළියෙළ කොට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන අංශයේ අධ්‍යක්ෂවරයා වෙත මෙහි පහත නියමිත දිනවලට මත්තෙන් ලැබෙන්නට එවිය යුතුය.

**දේශීය ඉල්ලුම් පත්‍ර:**— 1960 ඔක්තෝබර් 13 වැනි දින.

**විදේශීය ඉල්ලුම් පත්‍ර:**— 1960 ඔක්තෝබර් 20 වැනි දින.

2. මේ තනතුරුවලට නියමිත වැටුප් ක්‍රමය වූ කලී රු. 3,420 ක වාර්ෂික වැටුපකින් පටන්ගෙන රු. 120 ක වාර්ෂික පඩි වැඩිවීම් 4 කින් ද, රු. 180ක වාර්ෂික පඩි වැඩිවීම් 8 කින් ද, රු. 240ක වාර්ෂික පඩි වැඩිවීම් 6 කින් ද, වාර්ෂික වැටුප රු. 4,080ක් හා රු. 4,800 ක් සහ රු. 5,580ක් යන ස්ථානයන්ට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉම් සහිතව වාර්ෂික වැටුප රු. 6,780 දක්වා නගිනු ලැබේ.

3. (i) මේ තනතුරු ස්ථිරය. රජයේ විශ්‍රාම වැටුප් වාර්තාව යටතේ මේ තනතුරු විශ්‍රාම වැටුප් සහිතය. 1957 අප්‍රියෙල් 29 දින හා අංක 372 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛයට අනුව පත්කිරීමේ වකවානුවේ සිට 10 වසක් ඇතුළතදී ගැහැණු නිලධාරීන්ට කැමති නම් විශ්‍රාම වැටුප් හිමි සේවයට බැඳිය හැකිය. තෝරාගනු ලැබූ ඉල්ලුම්කරුවන් රජයේ ස්ථිර, විශ්‍රාම වැටුප් හිමි සේවයට අයිති නැත්නම් ඒ ඒ අවස්ථාවට යෙදෙන පරිදි තුන් අවුරුදු ප්‍රවාසන කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

(ii) (සාමාන්‍ය) පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයේ සිංහල භාෂා ප්‍රශ්න පත්‍රයෙන් (A නිර්දේශ පත්‍රය) සමත් වී හෝ සිංහල භාෂාවෙන් ඊට උසස් අධ්‍යාපනික සුදුසුකම් ලබා හෝ නැත්නම්, තෝරාගනු ලබන ධුරාපේක්ෂකයන් (සාමාන්‍ය) පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයේ සිංහල භාෂා ප්‍රශ්න පත්‍රයෙන් (A නිර්දේශ පත්‍රය) පත්වීමේ දිනය සිට අවුරුදු 3 ක් ඇතුළත, සමත් වී සිංහලෙන් අධ්‍යාපනික සුදුසුකම් ලබා ගැනීම අවශ්‍යය.

(iii) තෝරා ගනු ලබන ධුරාපේක්ෂකයන් රජයේ ව්‍යවස්ථා හා රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍ර තුනකින් යුත් විභාගයකින් පත්වීමේ දිනය සිට අවුරුදු තුනක් ඇතුළත සමත්වීම ද අවශ්‍ය ය. ඉන් එක් ප්‍රශ්න පත්‍රයක් රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි හා පාලන රෙගුලාසි පිළිබඳවය. එකක් මුදල් රෙගුලාසි පිළිබඳවය. අනික අධ්‍යාපන නීති පිළිබඳවය.

(iv) ඔවුන් තව දුරටත් වෘත්තියේ නිරත කරවීමට නුසුදුසු යයි සලකනු ලැබුනි නම්, ප්‍රවාසනයට/සේවා පරීක්ෂණයට යටත් කාල පරිච්ඡේදය තුළ හෝ එය අවසානයේ දී හෝ, තෝරා ගනු ලබන නිලධාරීන්ගේ සේවය ඕනෑම විටෙක නවත්වනු ලැබේ.

4. (i) සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම මෙහි පහත සඳහන් කරනු ලබන කොන්දේසි තෘප්ත කොට ඒ පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) දනටම රජයේ සේවයේ නියුක්ත නැත්නම්, 1960 ඔක්තෝබර් මස 13 වැනි දිනට වයස අවුරුදු 23ට අඩු හා අවුරුදු 40 ට වැඩි නොවිය යුතුය.

(ආ) මෙහි පහත දක්වෙන විෂයයන් එකක් හෝ වැඩි ගණනක් ඇතුව, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධි විභාගයෙන් සමත් වූ උපාධිධරයකු විය යුතු ය.

(1) උද්භිද විද්‍යාව.
(2) සත්ත්ව විද්‍යාව.
(3) රසායන විද්‍යාව.
(4) භෞතික විද්‍යාව.

ඉගැන්වීමේ පළපුරුද්ද වැඩිමනත් සුදුසුකමක් වනු ඇත.

(ඉ) සිංහල භාෂාව ගැන මනා දනුමක් ලබා සිටිය යුතුය. යටත් පිරිසෙයින් සිංහල ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ (සාමාන්‍ය තත්ත්වයේ සිංහල) සාමාන්‍ය පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයේ දී හෝ භාෂාවෙන් හෝ සාහිත්‍යයෙන් සමත් වූවන්ට වැඩි කැමැත්ත දක්වනු ලැබේ.

(ඊ) හොඳ කල් ක්‍රියාවෙන් යුක්ත හෝ ශාරීරිකව සුදුසු විය යුතුයි.

5. ඉල්ලුම්කරුවන් විසින් මෙහි පහත දක්වන ලියකියවිලිවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (මුල් පිටපත් ඇමිණිය යුතු නොවේ.—

(i) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතිකය භාරගනු නොලැබේ.)

(ii) ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකපත්‍ර.

(iii) කල් ක්‍රියාව පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක් (දනටම රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් සහතික අනවශ්‍යය.)

(iv) ධුරාපේක්ෂකයාගේ සිංහල දනුම පිළිබඳ ප්‍රවීන තැනැත්තෙකුගෙන් ලබාගත් සහතිකයක් හෝ ඒ පිළිබඳ සාක්ෂ්‍ය වශයෙන් ඉදිරිපත් කරන ලියවිලි.

දනටම රජයේ සේවයේ නියුක්ත වූවන් කල් ක්‍රියාව පිළිබඳ සහතික එවීමෙන් පමණක් නිදහස් කරනු ලබන බව සැළකිය යුතු සි.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ඉල්ලුම්පත්‍ර එවිය යුත්තේ ඔවුන්ගේ දෙපාර්මේන්තු ප්‍රධානයන් මගිනි. ඒ ඉල්ලුම්පත්‍ර නියමිත දිනට පසු මේ කාර්යාලයට ලැබුණහොත් එම දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත ඒවා නියමිත දිනට පෙර ලැබී ඔවුන් විසින් ප්‍රමාදයට හේතු දක්වා පිළිගැනීම මැනවයි නිර්දේශ කර නැතිනම්, ප්‍රමාද වූ ඉල්ලුම්පත්‍ර පිළිගනු නොලැබේ. උපකෘත පාඨශාලාවල නියුක්ත ශික්ෂකයන් විසින් ඔවුන්ගේ කළමනාකාරවරයන් මගින් ඉල්ලුම්පත්‍ර එවිය යුතුයි. රජයේ පාඨශාලාවල සිටින සහාය ශික්ෂකයන් විසින් ස්වකීය පාඨශාලා ප්‍රධානයන් මගින් ඉල්ලුම්පත්‍ර එවිය යුතු අතර, රජයේ පාඨශාලා ප්‍රධානයන්ට ඉල්ලුම්පත්‍ර කෙළින්ම එවිය හැකිය. නියමිත පෝර්මයෙහි සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම්පත්‍ර පිළිගනු නොලැබේ. මෙහි පහත දී තිබෙන ආදර්ශයෙන් පෝරමය පිටපත් කරගත යුතුයි. **මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ලබාගත නොහැකිය.** මේ දෙපාර්තමේන්තුවේ කවර හෝ නිලධාරියෙකු වෙත පෞද්ගලික වශයෙන් ඉල්ලුම්පත්‍ර එවිය යුතු නොවේ.

7. මෙම ගැසට්පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ පටන් ගැන්වීමේ පළ කර තිබෙන රජයේ සේවයේ තනතුරු වලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසිද බලනු මැනවි.

එස්. එෆ්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

අංකය. ඒ. බී. බී. 3331.
1960 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ පෝරමය

**I වැනි ශ්‍රේණියේ පාඨශාලා පරීක්ෂක තනතුර පිළිබඳ ඉල්ලුම්පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්)————.

2. ලිපිනය :————.
(සියලුම ලියුම් ආදිය මේ ලිපිනයට යවනු ලැබේ.)

3. (අ) විවාහකද යන වග :————.
(ආ) එසේ නම්, භාර්යාවගේ/පුරුෂයාගේ නම හා රක්ෂාවේ විස්තර :————.

4. (i) ඉල්ලුම්කරු උපන් දිනය හා ස්ථානය :————.
(ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය—දන්වීමේ 5 (1) ඡේදය බලන්න.)
(ii) ඉල්ලුම්කරුගේ පියා උපන් දිනය හා ස්ථානය :————.
(iii) ඉල්ලුම්කරුගේ පියාගේ පියා උපන් ස්ථානය :————.
(iv) ඉල්ලුම්කරුගේ පියාගේ, පියාගේත් පියා උපන් ස්ථානය : ————.

5. (අ) ඉල්ලුම්කරුගේ ජාතිය :————.
(ආ) ලාංකිකයකු නම්, ලියා පදිංචි කිරීමෙන් හෝ පරම්පරාවෙන් ද යන වග :————.

6. (අ) දූනට නියුක්ත රක්ෂාව හා එහි විස්තර :————.

(ආ) ශික්ෂකයකු නම් ලියාපදිංචි කළ අංකය හා දූනට ලබන වාර්ෂික වැටුප :————.

7. ශාස්ත්‍රීය සුදුසුකම් :————.
(සහතිකපත්‍ර පිටපත් ඇමිණිය යුතුය.)

(අ) උපාධියේ නම :————.

(ආ) විශ්ව විද්‍යාලය :————.

(ඉ) සූචි අංකය :————.

(ඊ) වර්ෂය :————.

(උ) විෂයයෝ :————.

(ඌ) බාහිර ද අභ්‍යන්තර ද යන වග :————.

8. වෘත්තීය සුදුසුකම් (පුහුණුව ලැබූ ස්ථානය හා කාලපරිච්ඡේදය සඳහන් කළ යුතුය) (ලබාගත් සහතික පත්‍රවල පිටපත් මීට සාක්ෂි වශයෙන් ඇමිණිය යුතුයි)

9. (අ) සිංහල දූනුම :————.

(ආ) දෙමළ දූනුම :————.
(දූන්වීමේ 5 (iv) ඡේදය බලන්න)

10. ඉගැන්වීමේ පළපුරුද්ද (පාඨශාලාවල නම් හා ඒ ඒ පාඨශාලාවේ ඉගැන්නූ කාල පරිච්ඡේදය දින සමග සඳහන් කරන්න.

| පාඨශාලාවේ නම | බැඳුණු දිනය | අස්වූ දිනය | සේවා කාලය | | | අස්වීමට හේතුව : ස්ථාන මාරුකොට යැවීමද, ඉල්ලා අස්වීමද, සේවය නැවැත්වීමද, සේවයෙන් පහ කිරීමද යනාදිය |
|---|---|---|---|---|---|---|
| | | | අ. | මා. | දි. | |
| | | | | | | |
| | | මුළු සේවය | | | | |

11. යුද්ධ සේවා සටහන :————.
(අස්වියැමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු යි.)

12. සහතික දෙන අයගේ නම් :————.
(සහතික තුනකට වැඩි නොවන ගණනක පිටපත් ඇමිණිය යුතු යි.)

13. අන්‍ය සුදුසුකම් :————.

————,
අත්සන.

දිනය :————.

9273

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### උයන්වත්තේ රජයේ ගුරු විද්‍යාලයේ ලලිත කලා උපදේශක තනතුර (පිරිමි හෝ ගැහැණු)

උයන්වත්තේ රජයේ ගුරු විද්‍යාලයේ ලලිත කලා උපදේශක තනතුර සඳහා 1960, ඔක්තෝබර් මස 14 වැනි දින තෙක් කොම්පඤ්ඤවීදියේ, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ "ගු. වි." ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ.

2. වැටුප් ක්‍රමය : මේ තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය (රු. 4,080 හා රු. 4,800ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව) වර්ෂයකට රු. 3,420—4×120—8×180—රු. 5,340 කි.

3. අවශ්‍ය අධ්‍යාපන හා අනික් සුදුසුකම් :

(i) සැලසුම් නිර්මාණය, පිළි පින්තාරු කිරීම සහ අනිකුත් කලා පිළිබඳ අධ්‍යාපන සුසුදුකම් ලබා යටත් පිරිසෙයින් අවුරුදු පහක ඉගැන්වීමේ පළපුරුද්දක් ඉල්ලුම්කරුවන් ලබා සිටිය යුතුය. පිළිගත් ලලිත කලා පාසලකින් සහතිකපත්‍රයක් හෝ ඩිප්ලෝමා සහතික පත්‍රයක් ඔවුන් ලබා සිටිය යුතුය. තවද ඔවුන් විසින් විදේශයක අභ්‍යාස පාඨමාලාවක් අනුගමනය කර තිබිය යුතු ය. සිංහල භාෂාවෙන් ද ඉතා හොඳ දූනුමක් ඉල්ලුම්කරුවන් ලබා සිටිය යුතු ය.

(ii) 1960, ඔක්තෝබර් මස 14 වැනි දිනට ඉල්ලුම්කරුවන් වයසින් අවුරුදු 25කට අඩු හෝ අවුරුදු 50කට වැඩි හෝ නොවිය යුතුයි. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව නො යෙදේ.

4 විශෙෂ කොන්දේසි :

(i) තෝරා ගනු ලබන ඉල්ලුම්කරු පළමුවරට උයන්වත්ත ගුරු විද්‍යාලයට පත්කරගත් ස්ථාන මාරුකර යැවීමට යටත් ය.

(ii) පහත සඳහන් කරනු ලබන ආකෘති පත්‍රයට අනුකූලව නියමිත පෝර්මයේ ඉල්ලුම් පත් ඉදිරිපත් කළයුතු යි. ඉල්ලුම් පත්‍ර පෝර්ම මෙම කාර්යාලය මගින් සපයනු නො ලැබේ. එහෙයින් දූන්වීමෙහි පළකර තිබෙන ආදර්ශ ආකෘති පත්‍රයෙන් පිටපතක් ඉල්ලුම්කරු විසින් පිළියෙළ කරගත යුතු ය.

(iii) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත ය. මෙම තනතුර සඳහා තෝරාගැනීමට පෙර විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ශික්ෂකයකු වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු පත් කරනු ලැබුවහොත් ඔහු/ඇය මෙම තනතුර දරන තෙක් මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිතයයි ප්‍රකාශ කරනු ලැබේ.

5. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදය පටන් ගැන්මේ පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි ද බලනු මැනවි.

ඊ. එච්. ද. අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

අංකය : ගු. වි./අ. 7881,
1960 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

### ආදර්ශ පෝර්මය

#### උයන්වත්තේ රජයේ ගුරු විද්‍යාලයයේ ලලිතකලා උපදේශක තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. 1960.10.14 වැනි දිනට නිවැරදි වයස :—.
අවුරුදු :——. මාස :——. දින :——.

4. ජාතිය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය :————.

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.

(ඉ) ඔහුගේ පිය පාර්ශවයේ මුත්තා :————.

(ඊ) ඔහුගේ පිය පාර්ශවයේ මී මුත්තා :————.

6. ලබාගත් දින සමඟ අධ්‍යාපන සුදුසුකම් (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතු යි.)

7. වෘත්තීය සුදුසුකම් :————.

8. ඉගෙනීම ලැබූ පාසල් හා විද්‍යාල (ඇතුළත් වූ හා අස්වූ දින සඳහන් කළ යුතු ය.)

9. ඉගැන්වීමේ පළපුරුද්ද :————.
(මෙහි පහත දැක්වෙන පෝර්මයෙහි විස්තර සඳහන් කරන්න).

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුළත් වූ දිනය | අස් වූ දිනය | දරූ තනතුර | සේවා කාලය | | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | අවු. | මා. | ද. | |
| | | | | | | | |
| | | | මුළු කාලය ... | | | | |

10. සිංහල භාෂාවෙන් ලබා තිබෙන සුදුසුකම් :————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල :————.

(සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය)

12. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම්

පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින් ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, පත් කිරීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනහොත් කිසිම වන්දි ගෙවීමක් නො මැතිව, මා රාජකාරියෙන් පහකරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

————————,

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————————.

9308

---

## ආහාර කොමසාරිස් තැනගේ දෙපාර්තමේන්තුව

### ප්‍රධාන පෝර්මන් තනතුර

ආහාර කොමසාරිස් තැනගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පෝර්මන් තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද, ඉල්ලුම් පත්‍ර 1960 ඔක්තෝබර් 8 දින හෝ ඊට පෙර ලැබෙන සේ, ආහාර කොමසාරිස්, 330, යුනියන් පෙදෙස, කොළඹ 2, යන ලිපිනයට එවිය යුතුය.

2. **වැටුප :** වර්ෂයකට රු. 960—72—2,112 (කාර්යක්ෂමතා කඩඉම රු. 1,608ට ප්‍රථම).

3. **අවශ්‍ය සුදුසුකම් :** සෑම අයදුම්කරුවෙක්ම පහත දැක්වෙන කරුණු පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) ලංකා පුරවැසියකු බව.

(ii) 1960 ඔක්තෝබර් 8 දිනට, වයස අවුරුදු 25 නොඅඩු බව හා අවුරුදු 45ට නොවැඩි බව, මෙම වයස් සීමාවන් දෙපාර්තමේන්තු සේවකයන් වෙනුවෙන් බලපානු නොලැබේ.

(iii) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සමත් බව.

(iv) මෝටර් වාහන (පැට්‍රල් සහ ඩීසල්) නඩත්තුව සහ අළුත්වැඩියාව සම්බන්ධයෙන් පළපුරුද්දෙන් ලත් මනා දැනීමක් ඇතිබව සහ වැඩපලවල් පරිපාලනය ගැන පළපුරුද්දක් ඇති බව.

(v) පිළිගත් පෞද්ගලික වැඩපලක පෝර්මන් කෙනෙකු වශයෙන් අවුරුදු 5ක සේවයක් තිබීම.

(vi) ලොරි පැදවීමේ බලපත්‍රයක් තිබීම.

**සැලකියයුතුයි.**—ඉහත සඳහන් සියළුම සුදුසුකම් ඇති අයදුම්කරුවන් නොමැති නම්, ඉහත සඳහන් (ii), (iii) සහ (iv) යන සුදුසුකම් ඇති අයදුම්කරුවන් ගැන සලකා බලනු ලැබේ.

4. **බඳවාගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු සහ අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලට මුදල් අයකරගනු ලැබේ.

5. **සේවා කොන්දේසි.**—මෙම පත්වීම, පළමුකොටම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වේ. තෝරා පත්කරගත් තැනැත්තා දැනටමත් විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම්, ඔහු පළමු කොට වැඩ බැලීමේ තත්ත්වයට පත් කරනු ලැබේ.

කේ. එම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### ප්‍රධාන පෝර්මන් තනතුර—ආහාර කොමසාරිස් තැනගේ දෙපාර්තමේන්තුව

(1) (අ) සම්පූර්ණ නම :————————.
(ආ) ජාතිය :————————.
(ඇ) ලිපිනය :————————.

(2) උපන් දිනය සහ ස්ථානය—
(අ) අයදුම්කරු :————————.
(ආ) අයදුම්කරුගේ පියා :————————.
(ඇ) අයදුම්කරුගේ සීයා (පිය පක්ෂයේ) :————————.

(3) 1960.10.8 දිනට වයස :————————.

(4) අධ්‍යාපනික සහ අනෙකුත් සුදුසුකම් (කාර්මික සහ අනෙකුත් සුදුසුකම් සහ පළපුරුද්ද සම්බන්ධ සහතිකවල පිටපත් අමුණා ඇත) :————————.

(5) ලොරි පැදවීමේ බලපත්‍රයේ අංකය සහ දිනය :————————.

(6) පාසලෙන් අස්වූ දින පටන් කල රක්ෂාව් (ඇත්නම්) : ————————.

(7) චරිත සහතික ලබා ගැනීමට හැකි අයවලුන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ රක්ෂාවන් :————————.

අත්සන :————————.

දිනය :————————.

9354

---

## ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව—රත්මලානේ ප්‍රධාන යාන්ත්‍රික ඉන්ජිනේරුතැනගේ අංශය

ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන යාන්ත්‍රික ඉන්ජිනේරුතැනගේ අංශයේ දෙවැනි ශ්‍රේණියේ (තාවකාලික) සැලසුම් තනතුරු දෙකක් සඳහා ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ.

2. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයෙහි අපේක්ෂකයෝ වයසින් අවුරුදු 21ට නොඅඩු, අවුරුදු 40ට නොවැඩි, මේ සුදුසුකම් ඇති වග තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ හැකි අය විය යුත්තාහ :

(අ) හොඳ පොදු අධ්‍යාපනයක් ලබා ඇති බව ;

(ආ) (යාන්ත්‍රික ඉන්ජිනේරු ශිල්පය, විදුලි ඉන්ජිනේරු ශිල්පය, නිර්මාණක ඉන්ජිනේරු ශිල්පය හෝ ඒ සමාන හෝ එයට උසස් හෝ විභාගයක් ආදී වශයෙන්) ලංකා කාර්මික විද්‍යාලයේ ඉන්ජිනේරු ඩිප්ලෝමා උපාධියක් සඳහා අවසාන පරීක්ෂණයෙන් සාමාර්ථය ලබා ඇති බව ; හෝ

(ඇ) ඉන්ජිනේරු වෙළඳ සමාගමක තුන් අවුරුද්දකට වැඩි කාලයක් යාන්ත්‍රික සැලසුම්කරුවෙකු වශයෙන් සේවය කර ඇති බව ; හෝ

(ඈ) ((අ) යටතේ මුලින් දක්වූ) ලංකා කාර්මික විද්‍යාලයේ ඉංජිනේරු ශිල්පය පිළිබඳ තුන් අවුරුදු පාඨ මාලාවකට අදාල පරීක්ෂණ දෙකකින් සාමාර්ථය ලබා, යාන්ත්‍රික ඉංජිනේරු සැලසුම්කරුවෙකු වශයෙන් සැහෙන පළපුරුද්දක් ඇති බව.

3. වර්ෂයකට රු. 1,260—120—රු. 3,780 (කා. කා. රු. 2,820 පෙර) පඩි ක්‍රම අනුව සුදුසුකම් හා පළපුරුද්දක් අනුව සැලකෙන පඩියක් පත්වීමේදී නියම කැරේ. ධුරය තාවකාලික, විශ්‍රාම වැටුප් රහිත වූවකි.

4. ඉල්ලුම්පත්‍ර පහත දැක්වෙන ආකෘතිය අනුව 1960.10.14 දින ප. ව. 4ට පෙර ලැබෙන පරිදි මරදානේ ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී වෙත එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර දුම්රිය දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට ඉදිරිපත් නොකළ යුතුය.

5. සම්මුඛ පරීක්ෂණයක් සඳහා තමන්ගේම වියදමෙන් මරදානේ ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරිගේ කාර්යාලයට අවශ්‍යවූ විට පැමිණීමට අපේක්ෂකයෝ සූදානම්ව සිටිය යුත්තාහ.

6. රත්මලානේ ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන යාන්ත්‍රික ඉන්ජිනේරුතැනගෙන් ඉල්ලා යවා වැඩි විස්තර ලබාගත හැකිය.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වෙනි ඡේදයේ මුල පළකර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් පිළිබඳ පොදු කොන්දේසිවලට අවධානය යොමු කැරේ.

බී. ඩී. රම්පාල,
සාමාන්‍යාධිකාරී.

1960 සැප්තැම්බර් 15 වැනි දා,
තැපැල් පෙට්ටිය අංක 355,
කොළඹ.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### රත්මලානේ ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන යාන්ත්‍රික ඉන්ජිනේරුතැනගේ අංශයේ (තාවකාලික) II වැනි ශ්‍රේණියේ සැලසුම්කරු තනතුරක් ඉල්ලීම

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————————.
පෙළපත් නාමය (අගට යෙදෙන නම) :————————.
අනික් නම් :————————

2. ලිපිනය :————————.

3. (අ) ලංකාවේ රට වැසියෙක් ද වග සඳහන් කරන්න :————.

(i) පරම්පරාගත ලාංකිකයෙක් ද, නැතහොත්,

(ii) ලියාපදිංචි කරවා ගැනීමෙන් රටවැසිකම ලැබූ ලාංකිකයෙක් ද :————.

(ආ) උපන් ස්ථානය—

(i) අයදුම්කරු :————.

(ii) අයදුම්කරුගේ පියා :————.

(iii) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(iv) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

**සංලක්ෂ්‍යය.**—අයදුම්කරුත් ඔහුගේ පියාත් උපන්නේ ලංකාවේ නම් :

(i) ත්, (ii) ත් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු හෝ ඔහුගේ පියා හෝ උපන්නේ ලංකාවේ නොවේ නම්, (i), (ii), (iii) හා (iv) ත් සම්පූර්ණ කළ යුතුය.

4. උපන් දිනය :————.

1960.10.14 වැනි දිනට වයස අවුරුදු :————, මාස :————, දවස් :————.

5. විවාහකද අවිවාහකද යන වග :————.

6. දැනට රක්ෂාවක් කරනවානම්, එය :————.

7. දැනට රක්ෂාවක් නැතිනම්, අන්තිමට යෙදුනු රක්ෂාව :————.

8. අධ්‍යාපන සුදුසුකම් :

පොදු :————.

පාසැල් :————.

සමත් වූ විභාගය :————.

කාර්මික :————.

කොතන ලැබුවේද :————.

සාමාන්‍ය ලැබූ විෂයයෝ :————.

9. හොඳින් දන්නා විෂයයනුත්, ඒවා එකිනෙක ගැන පළපුරුද් දක් කෙටියෙන් සඳහන් කරන්න :————.

10. පළපුරුද්දක් ඇත්නම් එය :————.

11. කිසියම් අපරාධයකට උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු නම් එය සඳහන් කර, දිනයත් වරදත් උසාවියේ නමත් නඩු නොම්මරයත් දක්වන්න :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා සඳහන් කළ විස්තර සත්‍ය බව සහතික කරමි. කිසි දිනෙක රජයේ සේවයෙන් අකාර්යක්ෂමතාවය පිණිස විශ්‍රාම නොගැන්වූ හෝ සේවයෙන් පහකරනු නොලැබූ හෝ බවත් ප්‍රකාශකරමි. මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විස්තර කිසිවක් අසත්‍ය හෝ වැරදි හෝ බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුව හොත් මා විසින්ම නුසුදුසු බවට පැමිණෙන වගද තෝරා ගැනීමට පසුව ඒ බව දැනගන්නට ලැබුන හොත් කිසිම වන්දියක් නොලැබ රාජ කාරියෙන් පහකිරීමට මා භාජනය වන වගද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**සැලකිය යුතුයි.**—(අ) අයදුම්කරුගේ අත් අකුරෙන් කෙටියෙනුත් නිවැරදිවත් පැහැදිළිවත් පෝරමය සම්පූර්ණ කළ යුතුයි.

(ආ) ළඟදී ලත් සහතික තුනකට නොවැඩි ගණනක පිටපත් ඉල්ලුම් පතට ඇමිනිය යුතුය.

(ඇ) (තාවකාලික) II වැනි ශ්‍රෙණියේ සැලැසුම්කරු යන්න ඉල්ලුම් පත බහා ලූ කවරයේ පිට සඳහන් කළ යුතුය.

9184

---

## රජයේ ලලිත කලායතනය

### පොත් නිදර්ශකයින්ගේ අභ්‍යාස පන්ති

ඉහත සඳහන් පන්ති පැවැත්වීම සඳහා යුනෙස්කෝ සංවිධානයෙන් මෙහි එවා ඇති එම සංවිධානයේ ඒ සම්බන්ධ විශේෂඥයා වන ජෑන් තොමියස් මහතා විසින් මෙම ආයතනයේ ශිෂ්‍යයින් නො වන අය උදෙසා 1960 ඔක්තෝබර් මස දී විශේෂ පන්තියක් මෙම ආයතනයෙහි පවත්වනවා ඇත.

මේ විශේෂ පන්තියට ඇතුළත් වීමට බලාපොරොත්තු වන අය 1960. 10. 4 වැනි දිනට ප්‍රථමයෙන් ලිපියකින් ඉල්ලුම් කළ යුතු ය.

මෙම පන්තියෙහි පුහුණුව සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ දී පහත සඳහන් අය ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ :—

(i) වෙළඳ චිත්‍ර ඇඳීමේ වෘත්තියෙහි යෙදී සිටින අය, පොත් නිදර්ශකයින් වශයෙන් සේවයෙහි යෙදී සිටින අය.

(ii) පිළිගත් චිත්‍ර කලා ආයතනවල උසස් පන්තියක පුහුණුව ලබා ඇති අය.

මේ විශේෂ පන්තියේ කාල සීමාව මාස 5 ක් පමණ වේ. සතියේ දින 4 ක පන්ති පැවැත් වේ. මේ පන්ති සවස 4.45 සිට 6.45 දක්වා පැවැත් වේ. මෙම ආයතනයේ නිවාඩු කාල වලදී පන්ති නො පැවැත් වේ. මේ පන්ති පැවැත්වීම සඳහා උවමනා කරන විදුලි බලය යනාදියට අවශ්‍ය ගෙවීම් කිරීම් වස් සාමාන්‍ය ගාස්තුවක් ශිෂ්‍යයින්ගෙන් අය කිරීමට සිදුවිය හැකිය. මේ පන්තියට ඇතුළත් කර ගත හැක්කේ සීමා සහිත ශිෂ්‍ය සංඛ්‍යාවක් බැවින් සුදුස්සන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනවා ඇත. එහෙයින් අවශ්‍ය වුවහොත් ඉල්ලුම් කරුවන්ට සිය නිෂ්පාදනයන් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට දන්වනවා ඇත.

මේ පන්තියට ශිෂ්‍යයින් බඳවා ගැනීම පිළිබඳ සෑම කටයුත්තක් සම්බන්ධයෙන් ම අධ්‍යක්ෂ තැනගේ තීරණය අවසාන තීරණය ලෙස සැළකේ.

ඇම්. ජේ. පෙරේරා,
වැඩ බලන අධ්‍යක්ෂ,
රජයේ ලලිත කලායතනය.

1960. 9. 19,
කොළඹ 7, 46, හෝර්ටන් පෙදෙස,
රජයේ ලලිත කලායතනය.

9365

---

## සංශෝධනයයි

### අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ සිංහල ගුරුවර ගුරුවරියන් II වන ශ්‍රේණියට හා I වන ශ්‍රෙණියට උසස් කිරීම

1960 සැප්තැම්බර් 9 වැනි දින අංක 12,196 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ 686 සහ 687 යන පිටුවල ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් ප්‍රළවූ නිවේදනයේ 2 වන වගන්තියේ පළමුවන පේලියේ සඳහන් " සුදුසුකම් නොලත් " යන්න " සුදුසුකම් ලත් " කියා විය යුතුය.

9160

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ඞී. එල්. එෆ්. ටෙන්ඩර් දැන්වීමයි

ප්‍රවාහණ හා රජයේ වැඩ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, 1960 නොවැම්බර් 16 වැනි දින පෙරවරු 11 දක්වා, රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 නොවැම්බර් 17 වැනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන බැවින් ඒ සඳහා පැමිණ සිටීමට කැමති ටෙන්ඩර්කරුවන්හට එසේ කළ හැක.

| ද්‍රව්‍ය | ටෙන්ඩර් අංකය |
|---|---|
| (1) ජේක් ලිප්ට් ට්‍රක් රථ | ඞී. එල්. එෆ්—62 |
| (2) රෙකර් ට්‍රක් රථයක් | ඞී. එල්. එෆ්—63 |
| (3) ජංගම දොඹකරයක් | ඞී. එල්. එෆ්—68 |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැන ගෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ටෙන්ඩර්කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි .

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 සැප්තැම්බර් 19 වැනි දින,
කොළඹ 2 දීය.

9360

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**කොළඹ වැලිකඩ බන්ධනාගාරයේ හිස් ගෝනි, විනාකිරි බෝතල්, ටින් ආදිය මිලට ගැනීම**

කොළඹ බන්ධනාගාර මූලස්ථානීය, බන්ධනාගාර කර්මාන්තාධිකාරී තැන විසින් කොළඹ වැලිකඩ බන්ධනාගාරයේ ඇති පහත දක්වෙන ද්‍රව්‍ය මිලයට ගැනීම සඳහා වර්ෂ 1960 ඔක්තෝබර් මස 14 වෙනි දින උදේ 9.30 දක්වා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ :—

| | |
|---|---|
| හිස් ගෝනි | 1250 |
| විනාකිරි බෝතල් | 450 |
| ගැලුම් 4 ටින් | 100 |
| ගැලුම් 45 පීප්ප | 10 |
| රාත්තලේ ඞී. සී. ඇල්. ටින් | 250 |

2. ටෙන්ඩර් පෝර්ම සඳහා, කොළඹ බන්ධනාගාර මූලස්ථානයෙහි රු. 25 තැන්පත් කොට, ඒ සඳහා ලබා ගන්නා ලද රිසිට් පත, ටෙන්ඩර්පත්‍රයට ඇමිණිය යුතුයි. යම් ටෙන්ඩරයක් භාරගත් බව ලියවිල්ලකින් දන්වා දින හතක් ඇතුළත එම ද්‍රව්‍ය ගෙනයාමට නො හැකි වුවහොත් හෝ පැහැර හැරියහොත් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ටෙන්ඩර්ය භාරගත් බව දන්වන ලියවිල්ල තමා විසින් දෙන ලද ලිපිනයට තැපැල් මාර්ගයෙන් යැව්වහොත් නැතහොත් ලිපිනයෙහි සඳහන් ස්ථානයෙහි තබා ඇතහොත් එය භාරගත් ලෙස සළකනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍රයෙහි, ගෝනියක මිල, ටින් එකක මිල, බෝතලයක මිල යනාදී වශයෙන් වෙන වෙනම සඳහන් කළ යුතුයි. ටෙන්ඩර්පත්‍ර මුද්‍රා කරන ලද ලියුම් කවරයක බහා කවරයේ වම් පස උඩ කෙළවරේ "හිස් ගෝනි ආදිය මිලට ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කොට, පහත නම් සඳහන් වන අයගේ ලිපිනයට එවිය යුතුයි. මේ සඳහා මුද්‍රිත පෝර්ම නො මැත.

4. ටෙන්ඩර්පත්‍ර වර්ෂ 1960 ඔක්තෝබර් මස 14 වැනි දින උදේ 10 ට කොළඹ බන්ධනාගාර කර්මාන්තාධිකාරී තැනගේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට පෙනී සිටීමට පුළුවන.

5. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වන වෙනත් තොරතුරු ඇතහොත්, පහත නම් සඳහන් අයගෙන් ලබාගත හැක.

ජේ. ඒ. පෙරුමාල්,
බන්ධනාගාර කර්මාන්තාධිකාරී.

1960 සැප්තැම්බර් මස 23 වැනිදා,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.
9311

---

## මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය

**මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයට පිරාපු නො. 1 පොල් කොහු සැපයීම**

1960-61 ආදායම් වර්ෂයේ ප්‍රථම භාගය තුළ එනම්, 1960 ඔක්තෝබර් මස සිට 1961 මාර්තු මස 31 වෙනි දින දක්වා මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයට පිරාපු නො. 1 පොල් කොහු සැපයීම පිණිස 1960 ඔක්තෝබර් මස 14 වැනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර මෙහි පහත අත්සන් කරන අය විසින් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළයුතු මුදල රු. 25 කි. මෙය බන්ධනාගාර මූලස්ථානයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් මුද්‍රණය කරන ලද ටෙන්ඩර් ආකෘතිය (පෝර්ම) පහත අත්සන් කරන අයගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ටෙන්ඩර් කරුවන් විසින් විශෙෂයෙන් සැලකිය යුත්තක් නම් තමා නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයේ අකුරෙන් හා ඉලක්කමින් දක්වීමයි. එසේ අකුරෙන් හා ඉලක්කමෙන් සඳහන් නොවූ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්‍ෂෙප කිරීමට ඉඩ තිබේ.

1960 ඔක්තෝම්බර් මස 14 වැනි දින පෙරවරු 9.30ට පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එකී වේලාවේදී කැමති ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවීමට නොසතුවූ ටෙන්ඩර් කරුවන් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් මගින් පිටත මුද්‍රා සහිත නම, ලිපිනය සහ සේවයද සඳහන් කොට ටෙන්ඩර් පත්‍ර පෞද්ගලිකවම ඒ සඳහා බලයලත් නිලධාරියෙකුට භාරදී කුවිතාන්සියක් ලබාගත් යුතුය.

වැඩි විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත යුතුයි.

ඊ. ඒ. ඇස්. ඩබ්ලිව්. පෙරේරා,
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ අධිකාරී.

1960 සැප්තැම්බර් මස 23 වැනි දින,
මීගමුව.

9310.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මොනරාගල උප කොට්ඨාශයේ හම්බෙගමුව ව්‍යාපාරයේ දෙවන කොටස ඉදිකිරීම සඳහා එවන ටැන්ඩර් පත්‍ර, කොළඹ මහ ලේකම් ගොඩනැගිල්ලේ 355 වන කාමරයෙහි වූ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් (ලිපිනය, තැ.පෙ. 500 කොළඹ 1.) 1960 නොවැම්බර් මස 8 වන අඟහරුවාදා පෙරවරු 10වන තෙක් භාරගනු ලැබේ.

2. වාරිමාර්ග හෝ දුම්රිය හෝ පොදු වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 100,000කට නො අඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ඉල්ලුම් කළ හැක. බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

3. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 250ක් ඕනෑම කච්චේරියක බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 නොවැම්ර් මස 4 වන සිකුරාද වනතුරු කායාලීල වේලාවන් තුළ දී ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. වැඩි විස්තර බණ්ඩාරවෙල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්‍ෂ වෙනුවට.

1960.9.3 දා, කොළඹදීය.

9249 .

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දක්ෂිණ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 ඔක්තෝබර් මස 27 වෙනි දින පෙරවරු 10 දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඇඹිලිපිටිය උපකොට්ඨාශයේ යාන්ත්‍රික අංශයේ කර්මාන්ත ශාලාව සහ අවට ප්‍රදේශයේ අතිරේක වැඩ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 18,000 ට හෝ ඊට වැඩි ගණන් වලට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ඇඹිලිපිටිය උපකොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුයි.

3. 1960 ඔක්තෝබර් මස 20 වෙනි දින සිට 22 වෙනි දින දක්වා (දෙදිනම ඇතුළුව අවසාන දින පමණක් පෙරවරු 10.30 වන තෙක්) කායාලීල වේලාවල් තුළදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම පිණිස ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියද, ලියාපදිංචි කරන ලද පොතද ඉදිරිපත් කළ යුතුයි. දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය එම වැඩ භාර නිලධාරීන්ගෙන් එම වැඩය හෝ වැඩ සතුටුදායක ලෙසට කරගෙන යන බවට සහ දැනට ආණ්ඩුව යටතේ තිබෙන වැඩ ප්‍රමාණය ගැනද සහතික ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

ඇම්. ජේ. ඇෆ්. ආර්. සේනාරත්න,
ඇඹිලිපිටිය උපකොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කායාලීලය,
ඇඹිලිපිටිය,
1960.9.15.

9349

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

දුම්රිය ස්ථානවලින් වෙනත් ස්ථානවලටද, වෙනත් ස්ථානවලින් දුම්රිය ස්ථානවලටද, බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම ඇතුළත්කොට, කල්මුනේ උප කොට්ඨාශය තුළ සියළුම රජයේ බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම සඳහා මඩකලපුවේ නැගෙනහිර කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන වර්ෂ 1960ක්වූ සැප්තැම්බර් මස 28 වෙනි බදාදා පෙ.ව. 9.30 දක්වා ටෙන්ඩර් භාර ගන්නේ ය.

ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ කල්මුනේ උප කොට්ඨාශය භාර නිලධාරි තැනගෙන් ලබා ගත හැකිවන අතර, සියළු විස්තර සහ තොරතුරු ඔහුගෙන් ලබාගත හැක.

තමන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත් කරුවන් බව ඔප්පු කළ හැකි අයවළුන්ට පමණක් වර්ෂ 1960ක්වූ සැප්තැම්බර් මස 27 වෙනි අඟහරුවාදා අ.භා. 4.30 වන තුරු ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. කල්මුනේ උප කොට්ඨාශය භාර නිලධාරි තැන වෙත රු. 25 (රුපියල් විසිපහක්) තැන්පත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

28. 9. 60 දින පෙ. ව. 10ට මඩකලපුවේ නැගෙනහිර කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝාලයේදී ටෙන්ඩර් විවෘත කරන අතර, එකී ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි සිටිය හැක.

ලංකාවේ පුරවැසියන් නොවන අයට, ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු නොලැබේ.

සී. පූපාලසිංහම්,
කල්මුනේ උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

9247.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

අනුරාධපුරයේ උතුරු මැද කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා වර්ෂ 1960 ක්වූ ඔක්තෝබර් මස 19 වන දින පෙරවරු 10 දක්වා පහත සඳහන් සේවයන් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

**ටෙන්ඩර් අංක, පී. ඇල්. 2.**
1960-61 වර්ෂයට වව්නියා දුම්රිය ස්ථානයේ සිට පදවිය ව්‍යාපාරයට සපයන බඩු වාහනවලින් ගෙනැවිත් භාරදීමට.

**ටෙන්ඩර් අංක, පී. ඇල්. 3.**
මහ ඇලකන්ඩිය පාරේ තුන්වන සැතපුමට ගල් දමා තාර දැමීම.

**ටෙන්ඩර් අංක, පී. ඇල්. 4.**
මහ ඇලකන්ඩිය පාරේ හතරවන සැතපුමට ගල් දමා තාර දැමීම.

**ටෙන්ඩර් අංක, පී. ඇල්. 5.**
මහ ඇලකන්ඩිය පාරේ පස්වන සැතපුමට ගල් දමා තාර දැමීම.

2. පළමු වැඩය සඳහා රුපියල් 20,000 කට හෝ ඊට වැඩි මුදලකට, පී. ඇල්. 3, 4 සහ 5 යන වැඩ සඳහා රු. 35,000 කට හෝ ඊට වැඩි මුදලකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් දැමීමට සුදුස්සෝ වෙත්.

3. අනුපිටපතකින් යුක්තවූ ටෙන්ඩර් පත්‍රිකා පදවිය වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ලබාගතයුතු අතර මේ සම්බන්ධව සියලු විස්තර එම කායඝාලයෙන් ලබාගතහැක. තවද ලාංකිකයන් සහ ලාංකික වෙළඳ සමාගම් පමණක් ටෙන්ඩර් දැමීමට සුදුස්සෝ වෙත්.

4. වර්ෂ 1960 සැප්තැම්බර් මස 19 වන සඳුදින සිට වර්ෂ 1960 ඔක්තෝබර් මස 17 වන දින දක්වා කායඝාල වේලාවලදී පමණක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

සී. සී. පී. ප්‍රනාන්දු,
වාරිමාර්ග ඉංජිනේරුතැන, පදවිය.

වාරිමාර්ග කායඝාලය,
පදවිය හංදිය.

9190

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ඊසාන කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960-61 මුදල් වර්ෂය තුළ කවුඩුල්ල උප කොට්ඨාශයේ බඩු ඇදීම සඳහා 1960 ඔක්තෝබර් මස 20 වෙනි දින පෙරවරු 9.30ට දෙපාර්තමේන්තුවේ රුපියල් 10,000 හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව එවිය යුතුය. මේ සඳහා පෝරම සහ වැඩි විස්තර කවුඩුල්ල උ. කො. භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝාලයෙන් ලබාගත හැකිය.

3. කවුඩුල්ල උ. කො. භාර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 සැප්තැම්බර් 23 වෙනි දින සිට ඔක්තෝබර් මස 14 වෙනි දින තෙක් ටැන්ඩර් පත්‍ර දෙනු ලැබේ. මේ දක්වා ඕනෑම කච්චේරියක හෝ කවුඩුල්ල වාරිමාර්ග කායඝාලයේ රු. 25ක ඇප මුදලක් තබා ඒ වෙනුවෙන් නිකුත්කරන ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. ඕනෑම ටැන්ඩර් පත්‍රයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම ඊ. කො. ප්‍රා. වා. ඉ. තැනගේ කැමැත්ත පරිදි කිරීමට බලය පැවරී ඇත.

5. ටෙන්ඩර් පත්‍ර (මුල් පිටපත) ලියාපදිංචි තැපෑලෙන් ඊ. කො. ප්‍රා. වා. ඉ. වෙත යැවිය යුතුය. එය යවන ලියුම්කවරයේ ඉහළ වම් කෙළවර "කවුඩුල්ල උ. කො. බඩු ඇදීම" යනුවෙන් සඳහන් කළ යුතුයි.

6. ටෙන්ඩර් පත්‍ර කැඳවන අවස්ථාවේදී ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ අයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

ජී. ඇස්. ඇම්. ෂොක්මන්,
කවුඩුල්ල උ. කො. වාරිමාර්ග ඉංජිනේරු තැන.

9104

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් පහත සඳහන් දේවල් පේරාදෙණියේ කෘෂිකර්ම විද්‍යාලයට ලබා ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 ඔක්තෝම්බර් මස 14 වෙනි දින පස්වරු 2.30 වනතෙක් භාර ගනු ලැබේ. (1960-61 මුදල් වර්ෂය ඇතුළත) :—

**පාන්.**—පේරාදෙනියේ කෘෂිකර්ම විද්‍යාලයේ නිවාස භාර නිලධාරි තැනට උවමනා වන පරිදි අවුරුද්දකට පාන් රාත්තල් 12,000ක් පමණ සැපයීමට.

**හරක් මස්.**—පේරාදෙනියේ කෘෂිකර්ම විද්‍යාලයේ නිවාස භාර නිලධාරි තැනට උවමනා වන පරිදි අවුරුද්දකට හරක් මස් රාත්තල් 6,500 ක් පමණ සැපයීමට. (සම්පූර්ණ බරින් සියයට 25 කට වඩා ඇට නොතිබිය යුතුයි)

**මාළු.**—පේරාදෙනියේ කෘෂිකර්ම විද්‍යාලයේ නිවාස භාර නිලධාරි තැනට උවමනා වන පරිදි අවුරුද්දකට මාළු රාත්තල් 1,500ක් පමණ සැපයීමට. (තෝර, පරව, බලයා, කෙලවල්ලා, මලට්, ගල්මාළු, ඉස්සො හා හාල්මැස්සො) මාළු වල ඔළු, බඩ ආදිය ශුද්ධ කළ යුතුයි.

**කරවල.**—පේරාදෙනියේ කෘෂිකර්ම විද්‍යාලයේ නිවාස භාර නිලධාරි තැනට උවමනා වන පරිදි අවුරුද්දකට කරවල රාත්තල් 500ක් පමණ සැපයීමට. (තෝර, බලයා, කට්ටා, කොඩුව, හාල්මැස්සො)

**ඉදිආප්ප.**—පේරාදෙනියේ කෘෂිකර්ම විද්‍යාලයේ නිවාස භාර නිලධාරි තැනට උවමනා වන පරිදි අවුරුද්දකට ඉදිආප්ප 80,000ක් සැපයීමට. උවමනා පිටි සපයනු ලැබේ. එක ඉදිආප්පයක බර අවුන්ස 2කට වඩා අඩු නොවිය යුතුයි.

**රෙදි සේදීම.**—පේරාදෙනියේ කෘෂිකර්ම විද්‍යාලයේ නිවාසයේ නැවතී සිටින ශිෂ්‍යයින්ගේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඒ අවට ඇති රසායනාගාරවල සහ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රෙදි සේදීමට. පහත දැක්වෙන දේ වලට ගණන් දක්වන්න :—

(1) පේරාදෙනියේ කෘෂිකර්ම විද්‍යාලයේ නිවාසයේ සිටින ශිෂ්‍යයින්ගේ රෙදි දස දිනකට වරක් බැගින් සේදීම, (කෑලි 14ක් පමණ එක ශිෂ්‍යයෙකුගෙන් එක වරකට ලැබේ.)

(2) විද්‍යාලයේ ශිෂ්‍ය නිවාසයේ හා රසායනාගාරවල පාවිච්චියට ගන්නා පහත සඳහන් රෙදි වගී :—

(අ) ඩස්ටර්ස්
(ආ) නැප්කින්ස්
(ඇ) තුවා
(ඈ) ඒප්‍රන්
(ඉ) මේසරෙදි
(ඊ) වෙනත් රෙදි කෑලි

තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරුට පේරාදෙනියේ මධ්‍යම පර්යේෂණායතනයේ පදිංචියට ගෙයක් දේනු ලැබේ. ගෙවල් කුලිය සඳහා අයකරන්නේ රුපියල් 2 කි. තමන්ගේ වියදමින් රෙදි සේදීමට සාදා ගන්නා කුඩාරම තමන් විසින්ම නඩත්තු කළ යුතුයි.

පාන්, හරක්මස්, මාළු, කරවල යටතේ දැක්වූ දේවල් මහනුවර වෙළඳපොළේදී, නුවර හෝ ඊරියගමදී භාරදීමට හැකිවන ගණන් දක්වන්න. ඉහත දැක්වූ ස්ථාන වලදී සැපයිය යුතුයි. අදිආප්ප කෘෂිකර්ම විද්‍යාලයේ ශිෂ්‍ය නිවාසයට සැපයිය යුතුයි. එක ඉදිආප්පයක් සැපයීමට යන වියදම ද දක්වන්න.

2. පේරාදෙනියේ මධ්‍යම පර්යේෂණායතනයේ කළමනාකාර තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති තුමා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙලවරෙහි "පේරාදෙනියේ, කෘෂිකර්ම විද්‍යාලයට පාන් සැපයීම" (වෙන ද්‍රව්‍යයක් නම් ඒ ද්‍රව්‍යයෙහි නම යෙදිය යුතුයි) යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇප තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නාම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් කටයුතු පිළිබඳ ලිපිකරුට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් බහා ලන ලද කවරයෙහි "පේරාදෙනියේ කෘෂිකර්ම විද්‍යාලයට පාන් සැපයීම" (වෙන ද්‍රව්‍යයක් නම් ඒ ද්‍රව්‍යයෙහි නම) යන්න ලියා ටෙන්ඩර්

කරුගේ නම සහ ලිපිනයද ඇතුළත් කළ යුතුයි. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණ හොත් ඔහු පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝරමයෙක ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුයි.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද, දේවළ මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසියාකාර ඉටු කළායින් පසුය. මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වූ දින සිට සති තුනක් යනතුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළි ගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන වෙත තබා ගනු ලැබේ.

11. පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලාංකික පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

12. කොන්ත්‍රාත්කාරයාට භාර දිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුනහොත්, හෝ ඔහු විසින් සඳහන්කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නාලෙස සලකනු ලැබේ.

13. 1934රේ 19වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකුට කොන්ත්‍රාත්කරු විසින් වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

15. වැඩ පැහැර හැර කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. වැඩි විස්තර පේරාදෙනියේ, රාජකීය උද්‍යානයේ කෘෂිකර්ම නිලධාරි (මූලස්ථාන) පරිපාලන තුමාගේ කාර්යාලයෙන් දැන ගත හැකිය.

ඒ. වී. රිචඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 ඔක්තෝබර් මස 13 වැනිදා,
පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

9151

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බතලගොඩ ගොවිපොළේ පොල් විකිණීම

කුරුණෑගල, මල්ලවපිටියේ කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන විසින් බතලගොඩ ගොවිපලෙහි ඇති පොල් 40,000ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1960 සැප්තැම්බර් 30 වෙනි දින පස්වරු 2.30 වන තුරු භාරගනු ලැබේ.

2. කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, මල්ලවපිටිය, කුරුණෑගල" යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "බතලගොඩ ගොවිපලේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක්ද සහිතව සීල් තබන ලද කවරය තුළ බහා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "බතලගොඩ ගොවිපලෙහි පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර්පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනහොත් ඔහු කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් දින දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත්කර ගත යුතුයි. එසේ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර්පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබාගනී.

9. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව තබා ගනු ලැබේ.

13 වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දක්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත පොල්වලට ගෙවා ඉවත්කර ගත යුතුයි.

16. පිළිගත් ටෙන්ඩර්කරු, පොල් සියල්ලටම සම්පූර්ණ මුදල ගෙවා ඉවත් කර ගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ දෙනු නොලැබේ.

17. මේ පිළිබඳව වැඩි විස්තර බතලගොඩ ගොවිපළ භාර කළමනාකාර තැනගෙන් දැනගත හැක.

ඒ. වී. රිවඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 සැප්තැම්බර් මස 14 වෙනි දින,
පේරාදෙණියේදීය.

9231

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කන්තලේ උක් ගොවිපල

### උක් කැපීම සහ පැටවීමේ ප්‍රමාණය අනුව ගෙවීම

ඉහත සඳහන් කාර්‍යය සඳහා සමූපකාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති, ජනපද වාසීන් හෝ කම්කරුවන් විස්සකට වැඩි සමූහයන් රැස්කර ගත හැකි ඕනෑම පුද්ගලයන්ට හෝ පහත සඳහන් ගාස්තු අනුව වැඩ දෙනු ලැබේ:—

(අ) ප්‍රධාන මාර්ගයේ සැ. 20ක් ඇතුළත ගමනාගමන පහසුකම් සපයන ලද ජනපදවාසීන්ට සෑම මැට්‍රික් ටොන් එකකටම රු. 7 බැගින් ද,

(ආ) ප්‍රධාන මාර්ගයේ සැ. 10ක් ඇතුළත ගමනාගමන පහසුකම් සපයන ලද ජනපදවාසීන්ට සෑම මැට්‍රික් ටොන් එකකටම රු. 7.50 බැගින් ද,

(ඉ) තාවකාලික නැවතීමේ පහසුකම් හා ඔවුන්ගේ ගම්වල සිට යෑම් ඊම් පහසුකම් සපයන ලද පිටපළාත්වල කම්කරුවන්ට සෑම මැට්‍රික් ටොන් එකකටම රු. 7.50 බැගින් ද,

(ඊ) ඉහත සඳහන් කිසිම පහසුකමක් නොසපයන ලද කම්කරු කණ්ඩායම්වලට සෑම මැට්‍රික් ටොන් එකකටම රු. 8 බැගින් ද ගෙවනු ලැබේ.

2. පහත සඳහන් විශෙෂ විස්තරයට අනුකූලව වැඩ කළ යුතුය:—

(1) උක් දණ්ඩේ කොළ සුද්ධ කිරීම.
(2) උක් දඬු පොළවේ මට්ටමට කැපීම.
(3) උක් දණ්ඩේ අග්ගිස්ස කපා දැමීම.
(4) කපන ලද උක් දඬු පස්, ගල් සහ වෙනත් රොඩු ආදිය නොමැතිව ට්‍රේලර් රථවලට පැටවීම.

3. උක් දඬු කම්හලට ගෙන යා හැකි වන අයුරු නිසි පිළිවෙලකට ටොන් 5 ට්‍රේලර් රථවලට පැටවිය යුතුය. එහිදී එක් එක් කණ්ඩායම විසින් කපා ඇති උක් දඬු ප්‍රමාණය කෙතෙක්දැයි කිරා බලනු ලැබේ. මේ වැඩ පිළිවෙලින් එක් එක් කම්කරුවාගේ වැඩ ප්‍රමාණය ගණන් ගත නොහැකි බැවින් වැඩ සඳහා ඉල්ලුම් පත් භාර ගත හැක්කේ කම්කරු කණ්ඩායම්වලින් පමණකි.

4. ඉහත විස්තර කර ඇති අන්දමට සාමාන්‍යාධිකාරිතැනගේ හෝ ඔහුගේ නියෝජිතයකුගේ හෝ අනුමතය ලෙස කාර්‍යය කිරීම සඳහා සෑම කම්කරු කණ්ඩායමකම නායකයා විසින් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. දිනපතාම පටවන ලද උක් ට්‍රේලර් රථ කම්හලට කිරා භාර දීමෙන් පසු ඒ සඳහා ලැබිය යුතු මුදල පසු දිනයේදී ගෙවනු ලැබේ. හිස් ට්‍රේලර් රථ උක් ගොවිපලට ගෙන ආ විට උක් දඬු ඒවාට පැටවීමට පහසුවන අන්දමට උක් අස්වැන්න කපා එකතු කළ යුතුය. සෑම නායකයකුටම ඔහුගේ කණ්ඩායමේ සිටින එක එක කම්කරුවා වෙනුවෙන් එක් එක් උක්කපන පිහිය බැගින් සපයනු ලැබේ. වැඩ අවසාන වූ පසු මෙම පිහියා හැකි තරම් හොඳ තත්ත්වයකින් ඔහු විසින් ආපසු භාර දිය යුතුය. ආපසු භාර දීමට නොහැකිවූ සෑම පිහියකටම රු. 4 බැගින් ඔහු විසින් ගෙවිය යුතුය.

5. කණ්ඩායම සතිය තුළ කරන ලද වැඩ ප්‍රමාණය සතුටුදායක නම් නියම වශයෙන් සතියෙහි දින හතම සේවය කරන ලද එක එක කම්කරුවා වෙනුවෙන් "වැඩ කෑලි ගණන්" ප්‍රමාණයන්ට අතිරේක වශයෙන් සතියකට රු. 7 බැගින් පිට පළාත්හි කම්කරුවන් කණ්ඩායම්වලට ගෙවනු ලැබේ. කාලගුණයේ නරක තත්ත්වය උඩ උක් අස්වැන්න කැපීම තාවකාලිකව නවත්වන්නට සිදුවුවහොත් අස්වැන්න කැපීමෙහි නොකඩවා නිරතවූවන්ට පමණක් වේතන මණ්ඩලයේ අනියම් කම්කරුවන්ට අදාලවන වේතන ප්‍රමාණයන්ට අනුව ගොවිපලේ වෙනත් වැඩ ඒ ඒ දිනයන්හිදී දෙනු ලැබේ. කිසියම් හේතුවක් නිසා යම්කිසි කම්කරුවකු හෝ කණ්ඩායමක් හෝ අස්වැන්න කැපීම නැවැත්වුවහොත් පැය 24ක් ඇතුළතදී ඔවුන් ඔවුන්ගේ පදිංචි ශාලාවලින් අස් විය යුතුයි.

6. මෙම අස්වැන්න කැපීම දැනටමත් කරගෙන යනු ලැබේ. සති තුණකදී උක් අස්වැන්න කපා අවසාන වීම සඳහා තවත් කම්කරුවන් දහක් පමණ වැඩිපුර අවශ්‍ය වේ.

වැඩි විස්තර කන්තලේ උක් ගොවිපලේ සාමාන්‍යාධිකාරිතැනගෙන් ලබගත හැක. 1960 ජූලි මස 29 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ දැන්වීම හා අනිත් දැන්වීමේ මෙයින් අවලංගුවන බව කරුණාවෙන් සලකන්න.

ඊ. එච්. ඩබ්ලිව්. ජයසේකර,
කන්තලේ උක් ගොවිපලේ සාමාන්‍යාධිකාරී.

1960 සැප්තැම්බර් මස 19 වැනි දින,
උක් ව්‍යාපාරයේදීය.

9386

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැ. පෙ. 529) කිරුළපනේ දෙපාර්තමේන්තු මධ්‍යම වැඩපලෙහි ගබඩා කොට ඇති පහත සඳහන් සේවයට අදාල නොවූ රථ වාහන අලෙවි කිරිම සඳහා ටෙන්ඩර් 1960 ඔක්තෝබර් මස 17 වෙනි දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ:—

1. විලීස් ජීප් සී. ඇන්. 8020
2. ඩොජ් වර්ගයේ ලොරිය සී.ඇල්. 4621
3. මොරිස් කොමර්ෂල් ලොරිය සී.ඇන්. 1399
4. මොරිස් කොමර්ෂල් ලොරිය සී.ඇන්. 1453
5. මොරිස් කොමර්ෂල් ලොරිය අයි.සී.1013
6. ඩොජ් ලොරිය සී.ඇල්. 4909
7. මොරිස් කොමර්ෂල් ලොරිය අයි.සී.1153
8. විලීස් ජීප් සී.වයි. 4180
9. බෙඩ්ෆර්ඩ් ලොරිය සී.ඇල්. 8242
10. ෆෝඩ් වී 8 ලොරිය සී.ඊ. 3289
11. ෆෝඩ් වී 8 ලොරිය සී.ඊ. 2925
12. ෆෝඩ් වී 8 ලොරිය සී.ඊ. 3018
13. ඩොජ් ටෙන්ඩර් ලොරිය සී.ඊ. 4163
14. විලීස් ජීප් සී.ඇල්. 8806
15. ඩොජ් ලොරිය සී.ඊ.4361

2. ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන ගෙන් 1960 ඔක්තෝබර් මස 12 වෙනි දින දාවල් 12 තෙක් ලබාගත හැකි ෆෝර්ම දෙකක ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුයි. කොළඹ ඉඩම් සංවර්ධන කාර්යාලයේ හෝ නගරයේ ලංකා බැංකුවේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ශීර්ෂය යටතේ හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. සියලුම ටෙන්ඩර් මුද්‍රා තබා ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය අදාල නොවූ වාහන මිළයට ගැනීම සඳහා ටෙන්ඩර්" යනු වෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැ. පෙ. 529, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලියුම් කවරයේ වම්පැත්තේ පහළ කෙළවරෙහි සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ පුද්ගලික නියෝජිත තැන විසින් ප්‍රධාන ගණකාධිකාරී ඇස්. නාමසිවායම් මහතාට භාරදී කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1960 ඔක්තෝබර් මස 17 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමැති ටෙන්ඩර් කරුවන්ට එකී අවස්ථාවේදී පෙනී සිටිය හැක.

5. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර අපේක්ෂිත ටෙන්ඩර් කරුවන්ට කිරුළපනේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ අනුමැතිය ඇතිව වාහන පරීක්ෂා කල හැකිය. ටෙන්ඩරයේ ඇතිවන සියලු වෙනස් කිරීම් හෝ මැකීම් ටෙන්ඩර් කරු විසින් සහතික කළ යුතුයි.

6. සාර්ථක වූ ටෙන්ඩර් කරු විසින් තමන්ට ටෙන්ඩරය පිළිගත් බැව් දැන්වූ විට ටෙන්ඩර් කරනු ලැබූ මුදල සම්පූර්ණයෙන් සතියක් ඇතුළත දී ගෙවිය යුතුයි. ඊට පසු දින 14 ක් ඇතුළත දී ගත් වාහන ආදිය ස්ථාන වලින් අස්කර ගත යුතුයි. බැහැර කිරීම සඳහා තමන් විසින්ම පිළිවෙලක් යොදා ගත යුතුවාක් මෙන්ම, නියමිත කාලසීමාව තුළදී අස්කර ගනු නොලබන සියලු වාහන ආදිය නැවත නැවත විකිණීම හෝ අන්කිසි අයුරකින් හෝ ඉවත් කරනු ලැබේ. ඊට පසු ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අනුදැනුමක් නොමැතිව විනා, අන් කිසි අයුරකින් වාහන සඳහා ඉදිරිපත් විය නොහැක. යම්හෙයකින් සාර්ථක වූ ටෙන්ඩර් කරු පැහැර හැරිය හොත්, ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛණයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය. ඊට පසු ඔහු හට රජයේ කිසිම කොන්ත්‍රාත්තුවක් සඳහා ඉදිරිපත් විය නොහැක.

7. ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම හෝ කොටස් වශයෙන් භාර ගැනීමේ හෝ නොගැනීමේ අයිතිය රජය සතුය.

ඇස්. නමසිවායම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1,
1960 සැප්තැම්බර් මස 15 දින දීය.

9250

## ලුණු දෙපාර්තමේන්තුව

ලුණු දෙපාර්තමේන්තුවට ඩීසල් ලොකමැටිව්ස් (Diesel Locomotives) නැමැති යන්ත්‍ර හයක් සැපයීම සහ ගෙනත් භාරදීම සඳහා ටැන්ඩර්පත්‍ර කොළඹ තවලේකම් ගොඩනැගිල්ලේ තැපැල් පෙට්ටිය අංක 570 දරණ කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 දෙසැම්බර් මස 28 වැනි දින බදාදා දවල් 12 වනතුරු භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග කොළඹ තැපැල් පෙට්ටිය අංක 539 දරණ ලුණු කොමසාරිස් තැනගෙන් ලබාගත්තා පෝර්ම කොලවලය. ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක බැඳ ඒ බවට කුවිතාන්සියක් 1960 දෙසැම්බර් 27 වැනි දින පස්වරු 3 ට පෙර ඉදිරිපත් කළවිට ටැන්ඩර් පෝර්ම දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස් තැන.

නො. ඊ. ජී. 230,
1960 සැප්තැම්බර් 23 වැනි දීන,
කොළඹ.

9316

## 1960ක්වූ ඔක්තෝබර් 1 වෙනිදා සිට 1961ක්වූ සැප්තැම්බර් 30 වෙනිදා දක්වා ඩීසල් තෙල්, එන්ජින් තෙල් සහ විදුලි භාණ්ඩ ගෙනයාම පිණිස ටෙන්ඩර කැඳවීම

1. ඉහත සඳහන් භාණ්ඩ ගෙන යාම සඳහා 1960ක්වූ ඔක්තෝබර් මස 4 වෙනි දින අඟහරුවාදා පූ. භා. 10 දක්වා ආණ්ඩුවේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන, තැ. පෙ. 540, කොළඹ විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. 1960ක්වූ ඔක්තෝබර් 3 වෙනිදා වනතුරු ගාල්ලේ ආණ්ඩුවේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ විදුලි ඉංජිනේරු තුමා විසින් ටෙන්ඩර පෝර්ම සහ වැඩි විස්තර නිකුත් කරනු ලැබේ.

3. 1960ක්වූ ඔක්තෝබර් මස 4වෙනි දින පූ. භා. 10ට ආණ්ඩුවේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේදී ටෙන්ඩර පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩරකරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

සාමාන්‍යාධිකාරී,
ආණ්ඩුවේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව.

9232

## ආණ්ඩුවේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව
### ගස් කැපීම

මෙම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් "ඊ" ලකුණ දරණ ඇල්පිටිය පාරේ වත්තෙගෙදර අම්බලම්ගොඩ පිහිටි පොල්ගස් සහ කිතුල් ගසක් ද කැපීමට මිලදී ගැනීමට හා ඉවත් කිරීමට වර්ෂ 1960 ඔක්තෝබර් මස 4 වෙනි අඟහරුවාදා පූ. භා. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර මැක්ලම් පාරේ ප්‍රධාන කාර්යාලයේදී භාරගනු ලැබේ.

2. සියළුම ටෙන්ඩර්පත්‍ර පිටපතක් ද සහිතව එවිය යුතුයි. ටෙන්ඩර්පත්‍ර දෙනු ලබන්නේ රු. 25 ක් ටෙන්ඩර් තැන්පත් මුදලක් සහ රු. 2 ක ටෙන්ඩර් ලියකියවිලි සඳහා මුදලක් කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ කොළඹ මැක්ලම් පාරේ පිහිටි රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ බවට කුවිතාන්සි ඉදිරිපත් කිරීමෙන් පසුවය. ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු අතර ටෙන්ඩර් ලියකියවිලි සඳහා තැන්පත් කරන මුදල නොගෙවනු ලැබේ.

3. 1960ක්වූ ඔක්තෝබර් මස 4 වෙනි දින පූ. භා. 10ට ආණ්ඩුවේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

4. ටෙන්ඩර් පත්‍ර සහ වැඩි විස්තර ගාල්ලේ බෙල්ග්‍රේව් හවුස් හී පිහිටි ආණ්ඩුවේ විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

සාමාන්‍යාධිකාරී තැන,
ආණ්ඩුවේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව.

9313

## කේ. වී. 33 නේ උඩින් අදින සම්ප්‍රේෂණ මාර්ගවල් ඉදිකිරීම

1. ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වෂී 1960ක්වූ දෙසැම්බර් මස 27 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග සහ විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන ( තැ. පෙ. 500, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවළුන් විසින් රු. 200 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද, රු. 50 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 50 හෝ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වෂී 1960 ක්වූ දෙසැම්බර් මස 19 වන දින වනතෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වෂී 1960 ක්වූ දෙසැම්බර් මස 27 වන අඟහරුවාදා පූ. භා. 10 ට ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ නො. 355 හේ කාමරයේ පිහිටි කෘෂිකර්ම, ඉඩම්, වාරිමාගී සහ විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කායඝීලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවසථවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ.
1960 ක්වූ සැප්තැම්බර් 23 වන දින දීය.

9369

## කොළඹ වරාය කොමිෂන් සභාව
### මහර ගල්වල පෙදෙසෙහි පොල් ගස්වල පලදාව බදු දීම

1960 ඔක්තෝබර් මස 15 වැනි දින සිට අවුරුද්දක කාල සීමාවක් මහර ගල්වල පෙදෙසෙහි වූ පොල් ගස්වල පලදාව බදු දීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් කොළඹ වරාය කොමසාරිස් තැන විසින් 1960 ඔක්තෝබර් මස 10 වෙනි සඳුදින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. කොළඹ වරාය කොමසාරිස් වරයාගේ කාර්යාලයෙහි රු. 25ක මුදලක් තැන්පත් කිරීමෙන් යථෝක්ත කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර්, පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය.

3. 1960 ඔක්තෝබර් මස 3 වෙනි සඳු දින පස්වරු 3 දක්වා කාර්යාලයෙහි වැඩ කරන වේලාව තුල දී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ඇත.

4. ටෙන්ඩරය පිළිබඳ වූ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ලැබේ.

ඒ. ඇස්. කොහොඹන් වික්‍රම,
වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
1960 සැප්තැම්බර් 14 වැනි දින,
කොළඹ.

9183

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

මහනුවර දුම්රිය ස්ථානයේ [illegible]රයේ දී දුම්රිය සේවක මණ්ඩලය හා මගීන් උදෙසා ද, දුම්රිය ස්ථානයේ වේදිකාවන් හිදී ද ආහාර පානාදිය විකිණීමේ වරප්‍රසාදයන් උදෙසා 1960 ඔක්තෝම්බර් මස 12 වෙනි බදාදා පෙ. ව. 11 වනතුරු කොළඹ, තැ. පෙ. 355 දුම්රිය සාමාන්‍යාධිකාරී තැනගේ කාර්යාලයේ ගැනුම් යෝජනා පත් මණ්ඩලයේ සභාපති තැන විසින් ලියා පදිංචි වූ ගැනුම් යෝජනාකරුවන්ගෙන්

ගැනුම් යෝජනා පත් භාර ගනු ලැබේ. මෙම ගැනුම් යෝජනා පත් භාර ගනු ලබන දිනයේ සිට 1961 සැප්තැම්බර් මස 30: 1962 සැප්තැම්බර් මස 30, හා 1963 සැප්තැම්බර් මස 30 වැනි දිනයන් වනතුරු තත්වානුකූලව බලපවත්වනු ලැබේ.

දුම්රිය වාණිජ අධිකාරි තැනගේ කාර්යාලයෙන් පෝර්ම කොළ ලබා ගෙන ගැනුම් යෝජනා පත් පිළියෙළ කොට අනුපිටපතක්ද සහිතව එවිය යුතුය. ගැනුම් යෝජනා පත්‍ර සඳහා තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 250 ක් දුම්රිය ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාලයක හෝ තැන්පත් කොට ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 ඔක්තෝබර් මස 11 වෙනි අඟහරුවාදා දවල් 12 වනතුරු ගැනුම් යෝජනා පත්‍ර පෝර්මයන් ලබාගත හැක.

"විශෙෂ" සහ "සාමාන්‍ය" විස්තර ප්‍රකාශණයන් සමඟ මෙම පත්‍රිකාවද ගැනුම් යෝජනා පත්‍ර සමඟ ලියුම් කවරයක බහා මුද්‍රා තබා කොළඹ තැ. පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරි තැනගේ කාර්යාලයේ "ගැනුම් යෝජනා පත් මණ්ඩලයේ" සභාපති තැන වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ගැනුම් යෝජනාකරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් හෝ දුම්රිය වාණිජ අධිකාරි තැන වෙත ගෙනවිත් භාර දිය හැක. එම ලියුම් කවරයෙහි ඉල්ලුම් කරන සේවය, නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. දුම්රිය වාණිජ අධිකාරි තැන එය වහාම ගැනුම් යෝජනා පත්‍ර බහාලන පෙට්ටියේ තැන්පත් කරන අතර ඒ වෙනුවට කුවිතාන්සියක්ද නිකුත් කරනු ලැබේ. ඉහත සඳහන් කරනු ලබන වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන ගැනුම් යෝජනා පත්‍ර භාර ගනු නොලැබේ.

ගැනුම් යෝජනාකරුවන් කැමැති නම්, ගැනුම් යෝජනා පත්‍ර විවෘත කරන වේලාවට ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ. ඉහත සඳහන් ඉල්ලුම් පත්‍ර භාර ගනු ලබන අවසාන දිනයේදී දුම්රිය වාණිජ අධිකාරි තැනගේ කාර්යාලයේදී මෙකී ඉල්ලුම් පත්‍ර විවෘත කරනු ලැබේ.

තමන් විසින් ඉල්ලුම් කරනු ලබන සේවය භාර ගැනීම සඳහා ගැනුම් යෝජනා පත්‍ර භාර ගැනීමේ අවසන් දිනයේ සිට සති තුනක් ගැනුම් යෝජනාකරුවන් බලාපොරොත්තුවෙන් සිටිය යුතුය.

වැඩි විස්තර වාණිජ අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

බී. ඩී. රම්පාල,
දුම්රිය සමාන්‍යාධිකාරි තැන.

තැ. පෙ. 355,
කොළඹ, 1960. 9. 19.

9361

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

ඇලුමිනියම් තහඩු සැපයීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960 වේ නොවැම්බර් මස 23 වෙනිදා වන බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර නියමිත පෝරම කොළවල ලියා අනුපිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. ඒ පෝරම කොළ බොරලැස්ගමුවේ වේරහැර පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක කාර්යාලයෙන් 1960 වේ නොවැම්බර් මස 22 වෙනිදා වන අඟහරුවාදා දවල් 12 වන තුරු ලබාගත හැකිය. ඒවා දෙන්නේ කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි කාර්යාලයෙහි රු. 100 ක ටෙන්ඩර මුදලක් තැන්පත් කොට ඊට ලැබුණු කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් වැඩි විස්තර දැනගත හැකිය.

සී. අයි. එඩ්වඩ්ස්,
ලංකා ගමනාගමන මණ්ඩලයේ
(වැඩ බලන) ලේකම් තැන.

1960.9.23 වෙනි දිනදීය.

9285

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

දකුණු මහනුවර ඩිපෝවේ වැට බැඳීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වැනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960 වේ ඔක්තෝබර් මස 5 වෙනි දින පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ. වැඩි විස්තර බොරලැස්ගමුවේ වේරහැර නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතාගෙන් ඉල්ලුම් කරන්න.

රු. 15,000 ක් සහ ඊට වැඩි ගණනක් යන කර්මාන්ත සඳහා ලියාපදිංචි කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝ වෙති. පරීක්ෂාකර බලා අනුමත කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත්‍ර ආදිය නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතා වෙත ඉදිරිපත් කළ යුතුයි. එවැනි සහතික පත්‍ර ඒ නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතා විසින් පිළිගත් පසු කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ වූ ලංගම ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත රු. 100 ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ යුතුයි.

නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතා විසින් 1960 වේ ඔක්තෝබර් මස 1 වෙනි දා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ලිපි නිකුත් කරනු ලැබේ. එසේ නිකුත් කරන්නේ ටෙන්ඩර මුදල් තැන්පත් කළ බවට දෙන කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

ලංගමයෙන් සපයන ටෙන්ඩර පෝරම කොළවල ඉල්ලුම් කළ යුතුයි.

සී. අයි. එඩ්වඩ්ස්,
ලංකා ගමනාගමන මණ්ඩලයේ වැඩබලන ලේකම් තැන.

1960. 9. 17.

9370

---

## මොණරාගල කච්චේරියේ ගරාජ සහිත ගොඩනැගිල්ලක් සෑදීම

මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් දොරවල් රහිත ගරාජ 4ක්, දොරවල් සහිත ගරාජ 2ක් සහ ගබඩා කාමරයකින්ද යුක්ත ගොඩනැගිල්ලක් සෑදීම සඳහා රජයේ ලියාපදිංචි කරනලද කොන්ත්‍රාත්කරුවන්ගෙන් 1960 ඔක්තෝබර් මස 14 වෙනි දින දවල් 12 වනතෙක් ටැන්ඩර් භාරගනු ලැබේ.

ටැන්ඩර් එවිය යුත්තේ මොණරාගල දිසාපතිතුමා විසින් සපයනු ලබන නියමිත පෝරම මගිනි. මෙම පෝරම 1960, ඔක්තෝබර් 13 වෙනි දින පස්වරු 3.00 දක්වා නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් පෝරම ලබාගැනීම සඳහා දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ රුපියල් 25ක මුදලක් තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩරයක්ම සුරක්ෂිත ලෙස සීල් තබා ලියුම් කවරයේ "ගරාජයක් සෑදීම සඳහා ටැන්ඩර්" යනුවෙන් සඳහන් කොට මොණරාගල දිසාපති තුමා වෙත ලැබෙන සේ එවිය යුතුයි. ටැන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට හෝ මොණරාගල කච්චේරියේ කාර්යාල සහායක තැන ළඟ ඇති ටැන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම කළ හැකිය.

තෝරාගත් ටැන්ඩර්කරු තම කොන්ත්‍රාත්තුව භාරගත් වහාම ඉහත සඳහන් ගොඩනැගිල්ල සෑදීමේ වැඩ පටන් ගත යුතුයි.

ටැන්ඩර් සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ හෝ භාර ගැනීමේ අයිතියද කොටසක් භාර ගැනීමේ අයිතියද සම්පූර්ණයෙන්ම මොණරාගල දිසාපති තුමා වෙත පැවරී තිබේ.

වී. පී. සිල්වා,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙනුවට.

1960 සැප්තැම්බර් මස 15 වැනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේදීය.

9248.

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

මොරවක ග්‍රාමීය ආරෝග්‍යශාලාවේ අළුත්වැඩියා කිරීම් සඳහා 1960 අගෝස්තු මස 5 වෙනි දින අංක 12,176 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ටෙන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

වී. ඊ. හේරත්,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 1960.9.19.

9373/1

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

ජලය සැපයීම සහ කාණු ක්‍රමයක් ඇතුළුව, නිවිතිගල මාතෘ නිවාසය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණය සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 ඔක්තෝබර් මස 12 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්නපුර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 සැප්තැම්බර් මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 68,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ටර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.9.19.

9373/2

---

කොළඹ රිජ්වේ ආයඞී ආරෝග්‍යශාලාවේ සුවකළ නොහැකි රෝගීන් සඳහා ඇති කොටස කඩා දැමීම සහ ඉවත් කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 ඔක්තෝබර් මස 12 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ නැගෙනහිර කොළඹ භාර ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරුතැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 සැප්තැම්බර් මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචි පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.9.19.

9373/3

---

පානදුර විදුලිබල දෙපාර්තමේන්තුවේ 1ඒ ශ්‍රේණියේ නිවාසයක් ළිඳක් සමග තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් වෂී 1960 ඔක්තෝබර් මස 12 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ දකුණු කොළඹ භාර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වෂී 1960 සැප්තැම්බර් මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 26,300ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.9.19.

9373/4

---

අනුරාධපුරයේ ප්‍රාදේශීය සමුපකාර අධ්‍යාපනික මධ්‍යස්ථානය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් වෂී 1960 ඔක්තෝබර් මස 12 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අනුරාධපුරයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 සැප්තැම්බර් මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 33,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.9.19.

9373/5

වැල්ලවායේ සහතික කළ මිල ක්‍රම ගබඩා වහලය අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 12 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොස්ලන්ද ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් " ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.9.19.

9373/6

---

මහව ග්‍රාමීය ආරෝග්‍යශාලාවේ දෙවෙනි ඇපොතිකරිතැනට නිවාස සහ ගරාජයක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 12 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහව ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 38,200ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් " ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.9.19.

9373/7

---

මොරවක ග්‍රාමීය රෝහල අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 12 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මාතර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 15,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් " ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.9.19.

9373/8

---

# බඩු බාහිරාදිය විකිණීම

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර සෞඛ්‍ය සේවාධිකාරී කොට්ඨාශය

### රජයේ ගිලන් රථයක් විකිණීමයි

වලස්මුල්ල රෝහලේ අංක සී. ඇල්. 2746 දරණ ඔස්ටින් ගිලන් රථය වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 5 දින සවස 4ට වලස්මුල්ලේ ආරෝග්‍යශාලාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම් දෙමි. මෙම වෙන්දේසිය අවසානයේදී මුදල සම්පූර්ණයෙන්ම ගෙවන්නට සූදානම් විය යුතු බවත් ගිලන් රථය එදින සිට දින තුනක් ඇතුළතදී ගෙන ගිය යුතු බවත් දන්වමි.

සතියේ දිනවල උදේ 9 සිට සවස 4.30 දක්වා වුවමනා වේලාවක ඉහත සඳහන් ස්ථානයේදී මේ වාහනය පරීක්‍ෂා කළ හැකිය.

ඇම්. පී. ද සිල්වා,
සෞඛ්‍ය සේවාධිකාරී තුමා වෙනුවට.

වර්‍ෂ 1960ක්වූ සැප්තැම්බර් මස 13 වන දින,
මාතර සෞඛ්‍ය සේවාධිකාරී කාර්යාලය.

9136

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර සෞඛ්‍ය සේවාධිකාරි කොට්ඨාශය

### රජයේ ගිලන් රථයක් විකිණීමයි

මාතර රෝහලෙ අංක සී. ඇන්. 1546 දරණ ඔස්ටින් ගිලන් රථය වර්ෂ 1960 ඔක්තෝබර මස 5 වැනි දින උදේ 10 ට, මාතර ආරෝග්‍යශාලාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දනුම් දෙමි. මෙම වෙන්දේසිය අවසානයේදී මුදල සම්පූර්ණයෙන් ගෙවන්නට සූදානම් වියයුතු බවත්, ගිලන් රථය එදින සිට දින තුනක් ඇතුලතදී ගෙන ගිය යුතු බවත් දන්වමි.

සතියේ දිනවල් උදේ 9. සිට සවස 4.30 දක්වා උවමනා වේලාවක ඉහත සඳහන් ස්ථානයේදී මේ වාහනය පරීක්ෂා කළ හැක.

ඇම්. පී. ද සිල්වා,
සෞඛ්‍ය සේවාධිකාරි තුමා වෙනුවට.

වර්ෂ 1960 ක්වූ සැප්තැම්බර් මස 16 වැනි දින,
මාතර, සෞඛ්‍ය සේවාධිකාරී කාර්යාලයයේදීය.

9328

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර කොට්ඨාශය

### සේවයට අයෝග්‍ය ගිලන් රථ වෙන්දේසියේ විකිණීමයි

රත්නපුර නව මහ රෝහලේදී සේවයට අයෝග්‍ය අංක සී. වී. 3449 " තෝමස් fපෝඩිසන් " ගිලන් රථය හා සී. ඇල්. 7468 දරණ " ඔස්ටින් " ගිලන් රථයද 1960වේ ඔක්තෝබර් මස 13 වැනි දින පෙ. ව. 10ට පටන්ගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වාහන ගැනුම් කරුවන් විසින් සම්පූර්ණ මුදල ගෙවා ගිලන් රථ භාර ගත යුතුය.

මෙම වාහන රත්නපුර මහ රෝහලේ වෛද්‍ය අධිකාරි සමග සාකච්ඡා කොට පෙ. ව. 10යේ සිට ප. ව. 4 දක්වා ඔක්තෝබර් 10, 11 සහ 12 වැනි දිනවල පරීක්ෂා කර බැලිය හැක.

ඒ. කේ. ඇම්. පෙරේරා,
සෞඛ්‍ය සේවා අධිකාරී.

1960 සැප්තැම්බර් මස 14 දින,
රත්නපුරේ සෞඛ්‍ය සේවා අධිකාරි කායර්‍යාලයේදීය.

9189

## විශෙෂ නිවේදනයයි

1960 සැප්තැම්බර් 26 වැනි සඳුදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1960 සැප්තැම්බර් 30 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 සැප්තැම්බර් 24 වැනි සෙනසුරාදා පස්වරු 12.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 සැප්තැම්බර් 9 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

8945

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.